ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනය ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

එකතුව රු.3,835,000 ක් සිව් වර්ගයක ගොඩනැගිලි යලි ඉදිකිරීම් කර්මාන්ත ප්‍රාග්ධනිත කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 අනුකූල නොවීම්
------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) මුදල් රෙගුලාසි 371 | 156,215 | සභාවේ පූර්වගාමී සභාපතිවරයෙකුට ගෙවන ලද තත්කාර්ය අත්තිකාරම් පසුගිය වසර 17 |

| | | | |
|---|---|---|---|
| | | | පුරාම නිරවුල් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 547,672 | කල් ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ | | |
| (i) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 | | එක් එක් මාසය සඳහා වූ වාහන දෛනික ධාවන සටහන් පසුව එළඹෙන මාසයේ 15 වෙනි දිනට ප්‍රථමයෙන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | | සභා වාහනවල ඉන්ධන දහනය වසරක කාලයක් පුරා පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛය 2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 | | පරිපාලනමය වශයෙන් හෝ බලතල පැවරීම් යටතේ මුදල් භාර ගැනීම සහ බඩු ගබඩා සුරක්ෂිතව තබා ගැනීමේ වගකීම පැවරුණු නිලධාරීන් විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,505,060 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,252,348 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 80,000 | - | 47,750 | - | 103,000 | - | 95,800 | - |
| (ii) කුලී | 884,800 | - | 1,441,720 | 152,050 | 1,028,200 | - | 855,300 | 77,700 |
| (iii)බලපත්‍ර ගාස්තු | 83,500 | - | 620,210 | 7,190 | 22,000 | - | 77,150 | 7,190 |
| (iv)වෙනත් ආදායම | 1,582,250 | - | 3,134,986 | 2,755,190 | 1,575,300 | - | 2,236,641 | 2,683,200 |
| එකතුව | 2,630,550 | - | 5,244,666 | 2,914,430 | 2,728,500 | - | 3,264,891 | 2,768,180 |

2.2.2 වරිපනම් හා බදු

------------------

ජල බදු

---------

පානිය ජලය සපයන මාසය තුළදී ජල බද්ද අයකර නොතිබූ නිසා සමාලෝචිත වර්ෂය තුළදී හිඟ මුදල් රු.47,040 පැවති බැව් නිරීක්ෂණය විය.

2.2.3 පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව හිඟ කඩ කුලි සහ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු වශයෙන් පිළිවෙලින් පසුගිය වසර 02 ක් සඳහා රු.82,550 ක් හා රු. 152,599 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) කුලී පදනම මත සංචාරකයන්ට නිකුත් කළ වාහන වෙනුවෙන් වූ හිඟ කුලි වශයෙන් වූ රු.15,500 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) වෙනත් ආදායම්

----------------

පසුගිය වසර 02 සඳහා වූ මාර්ග තලන සේවා සහ ජල සැපයුම් සේවා සඳහා හා හිඟ පෙර සේවා ගාස්තු වශයෙන් එකතුව රු.517,400 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

----------------

2017 දෙසැම්බර් 31 දිනට උතුරු පළාතේ ප්‍රධාන ලේකම් වෙතින් රු.15,487 ක්වූ මුද්දර ගාස්තු දිගින් දිගටම අයවීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුභසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවූ කරුණු පහත සඳහන් පරිදි විය.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. දෛනික රැස් කෙරෙන කසළ කැබලි කර පස්දමා වසා නොතිබුණි.
ii. මදුරුවන් සහ කීටයක් පැතිරීම සහ දුර්ගන්ධය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

සභාවට අයත් සුසාන භූමි 06 ක දේහ ආදහනය කිරීම සඳහා අනුමැතිය ලබාගෙන නොතිබූ අතර, ඒ සඳහා සුසාන භූමි බදු අයකර ගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් දේපළ වෙනුවෙන් ලේඛන නඩත්තු කර නොතිබූ අතර, පසුගිය වසර 05 පුරාම, වරිපනම් හා බදු අයකිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ඩෙල්ෆ් වෙත මුහුදෙන් ගමන් කිරීම සඳහා භාවිතා කළ නැදුන්කරාගායි බෝට්ටු සේවය සඳහා සමාලෝචිත වර්ෂය සඳහා යාත්‍රිකයාගේ වැටුප් හා ඉන්ධන වෙනුවෙන් එකතුව රු.1,846,295 ක මුදලක් ගෙවා තිබුණි. එසේවුවත්, මගීන්ගෙන් ලද ටිකට්පත්‍ර ගාස්තුව එම වියදම ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවුයෙන් සභා අරමුදල අර්බුදකාරී තත්ත්වයක පවතින බැව් නිරීක්ෂණය විය.

3.4 මානව සම්පත් කළමනාකරණය
---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව මානව සම්පත් බඳවා ගැනීම හා යෙදවීම විධිමත්ව සිදුකර නොමැති බැව් විගණනයේදී නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එවැනි සම්පත් 11 ක් විසින් නිමකළ යුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

(ආ) සේවයෙන් විශ්‍රාමගිය නිලධාරියෙකුගෙන් ලැබිය යුතු රු.11,630 ක කාර්යමණ්ඩල ණය අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 03 තිස්සේ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය
---------------------------

3.5.1 වත්කම් භාරදීමට අසමත්වීම
-------------------------------

පසුගිය වසර 03 සිට වසර 15 ක් තිස්සේ සභාව විසින් භාවිතා කළ වාහන හයක් සභාවට අයත් නොවී තිබුණි.

3.5.2 අක්‍රීය වත්කම්
------------------

ජල සැපයුම් බවුසරයක් පසුගිය වසර 05 ක් පුරාම භාවිතා කිරීමෙන් තොරව සභාවේ අක්‍රීයවී තිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය
-------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන2018 මාර්තු 31 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතුව තිබුණි. එසේවුවද, ඒවා ඉදිරිපත් කරන ලද්දේ 2018 මැයි 18 දින බැවින් ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

4.2 අයවැය පාලනය
----------------

අයවැය ගත ආදායම් හා තත්‍ය ආදායම් අතර රු.32,250 සිට රු.1,286,560 දක්වා හෙවත් සියයට 40 සිට සියයට 102 දක්වාත්, අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර රු.3,000 සිට රු. 3,817,910 දක්වා හෙවත් සියයට 24 සියයට 100 දක්වාත් වූ පරාසයක විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ  අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| ගිණුම්කරණය | පාඩු ලේඛනය, වීථි ලාම්පු ලේඛනය, මිණුම් පත්‍රිකා ලේඛනය, ඉඩම් විකුණුම් මත බදු ලේඛනය සහ සේවක ඇප ලේඛනය නඩත්තු කිරීමට අසමත් වීම. |